# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1643/27 - 2010 මාර්තු 04 වැනි බ්‍රහස්පතින්දා - 2010.03.04

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**අම්පාර නගර සහා බල ප්‍රදේශයෙන් සමන්විත වන**
**අම්පාර නාගරික සංවර්ධන ප්‍රදේශය සඳහා වූ සංවර්ධන සැලැස්ම අනුමත කිරීම**

නාගරික සංවර්ධන හා පූජා භූමි සංවර්ධන අමාත්‍ය, දිනේෂ් චන්ද්‍ර රූපසිංහ ගුණවර්ධන වන මම 1982 අංක 4 දරන නාගරික සංවර්ධන අධිකාරි (සංශෝධිත) පනත යටතේ 8 "ඊ" වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර 2009 නොවැම්බර් මස 26 වැනි දින නාගරික සංවර්ධන අධිකාරියේ කළමනාකරණ මණ්ඩලය විසින් කරන ලද නිර්දේශයන් සැළකිල්ලට ගෙන අම්පාර නගර සභා බල ප්‍රදේශයෙන් යුක්ත වන අම්පාර නාගරික සංවර්ධන බල ප්‍රදේශය සඳහා වූ සංවර්ධන සැලැස්ම මෙයින් අනුමත කරමි.

දිනේෂ් චන්ද්‍ර රූපසිංහ ගුණවර්ධන,
නාගරික සංවර්ධන හා පූජා භූමි සංවර්ධන අමාත්‍ය.

2009 නොවැම්බර් මස 26 වැනි දින,
" සෙත්සිරිපාය "
බත්තරමුල්ල.

03 - 417/1

---

**අම්පාර නගර සභා බල ප්‍රදේශය සඳහා සංවර්ධන සැලැස්ම අනුමත කිරීම**

1982 අංක 4 දරන නාගරික සංවර්ධන අධිකාරි (සංශෝධිත) පනතේ 8 වගන්තියේ බලතල ප්‍රකාර නාගරික සංවර්ධන අධිකාරිය විසින් සකස් කරන ලද අම්පාර නගර සභා බල ප්‍රදේශය සඳහා වූ සංවර්ධන සැලැස්ම නාගරික සංවර්ධන හා පූජාභූමි සංවර්ධන අමාත්‍ය, දිනේෂ් චන්ද්‍ර රූපසිංහ ගුණවර්ධන මැතිතුමා විසින් එම සංශෝධිත පනතේ " 8ඊ " වගන්තියෙන් එතුමන් වෙත පැවරී ඇති බලතල ප්‍රකාර 2009 නොවැම්බර් මස 26 වැනි දින අනුමත කරන ලද බවත්, මෙම ගැසට් නිවේදනය පළවූ දින සිට එය බලපැවැත්වෙන බවත් මහජනතාවට මෙයින් දැනුම් දෙමි.

ප්‍රසන්න සිල්වා,
අධ්‍යක්ෂ ජනරාල්,
නාගරික සංවර්ධන අධිකාරිය.

2010 මාර්තු මස 03 වැනි දින,

03-417/2


1A - G 12509— 430 (2010/02) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.